# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2099/5 - 2018 නොවැම්බර් මස 27 වැනි අඟහරුවාදා - 2018.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

බලය පැවරීමේ නියෝගය

උතුරු මැද පළාතේ පළාත් සභාවේ 2009 අංක 05 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර මාරප්පුල්ලිගේ ජයසිංහ වන මම උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමූපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමඟ කියවෙන 2009 අංක 05 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ බලතල වලින් උතුරු මැද පළාතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාට සහය වීමට සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා පත්කර ඇත්තා වූ පහත සඳහන් උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් අය වෙත එම උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියලු බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

මාරප්පුල්ලිගේ ජයසිංහ,
ආණ්ඩුකාරවර,
උතුරුමැද පළාත.

2018 ඔක්තෝබර් මස 17 වැනි දින,
ආණ්ඩුකාර කාර්යාලය,
උතුරු මැද පළාත,

උපලේඛනය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| මහන්තේ මුදියන්සේලාගේ නිහාල් සෙනෙවිරත්න | 2018 සැප්තැම්බර් | උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමූපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමඟ කියවෙන 2009 අංක 05 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 03, 04, 05, 06, 07, 08, 44, 45, 58 (58(3), 58(4) හා 58(5) හැර), 59 වගන්තියේ (1) ආ හැර) වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල හා 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ සම්පාදිත 1973 සමූපකාර රීති මාලාවේ 04, 11, 16(II), 19, 33, 35, 37, 39, 40, 41(41(I) අ හැර) 42, 49, (49(XII) හැර), 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල. |

12-199


1A - PG 4321 — 37 (2018/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*